

# අඳුන් සිහින 11

හේමමාලා හේරත් ලියන නවකතාව

*මෙතෙක් කතාව*

*රිදීමා, මහීකා, රුචිරා සහ අමා ශ්‍රී ලංකාවේ සිට මෙල්බර්න් කරා පැමිණි විශ්වවිද්‍යාල ශිෂ්‍යාවෝය. රිදීමා තමා දක පුරුදු තරුණයෙකු නිතර දකී. එහෙත් ඔහු කවුදැයි කීමට තරම් මතකයක් ඇයට නැත. වෛද්‍ය ශිෂ්‍යාවක වන අමා, ඇයව මෝහනය කරනා මුත්, රිදීමාට ඔහු හා සම්බන්ධ අතීතයක් කරා යාගත නොහැකි වේ. මේ අතර මහීකාගේ පෙම්වතා වන අජය ගේ ලඟම මිතුරා දිනූෂගේ සිතෙහිද රිදීමා ගැන ආදරයක් හටගනී. නිශ්ක නැමැති තරුණයා පිළිබඳව රිදීමාගේ සිතෙහි ඇත්තේ කුමන හැඟීමක්දැයි යහළුවන් සියල්ලන්ටම ඇත්තේ ගැටළුවකි. රිදීමා මින් පීඩා විඳී. අවසන එම රහස කුමක්දැයි සොයා, බලා, ඒ විසඳ ගැනීම සඳහා සැවොම ලංකාව බලා පියාසර කරති. නිවසේ වැඩට ඉන්නා පිංචි කෙල්ල කෙල්ලගෙන් තොරතුරු දැනගැනීමට රිදීමා තනන අතර අජයද ගම්වැසියන්ගෙන් මෙම රහස පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට වෙහෙසෙයි.*

*එතැන් සිට:*

යහළුවන් එන ශබ්දය, කාමරය අවුස්සමින් සිටි රිදීමාට ඇසුණේ නැත. ඈ, ඉතා පරීක්ෂාකාරී ලෙස කාමරයෙහි වූ සෑම අස්සක්, මුල්ලක්ම සෝදිසි කළාය. විශාල පැරණි කැටයම් සහිත අල්මාරියේ, ඇගේ ඇඳුම් පිළිවෙලකට නවා, අසුරා තිබිණි. එහි වූ සමහර ගවුම් තමා කවදා ඇන්දාදැයි ඇයට මතකයක් නොවීය.

ඇය නැවී, එහි වූ ලාච්චු විවර කළාය. යුවතියක විසින් එක් රැස් කළා යැයි සිතිය හැකි ලට්ට ලොට්ට රැසක් එහි වූයේය.

විදේශ මුද්දර පොතක්, පින්තූර කපා අලවන ලද තවත් පොතක් පාට, පාට කොන්ඩා කටු, පීත්ත පටි, ඒ අතර වූ සමනලයෙකුගේ හැඩය ගත් කොන්ඩ කටුව, විවිධ මාදිලියේ කරාබු, වීදුරු වළලු........ රිදීමා සියල්ල දෙස බලා සිටියාය. මේවා, කවදා, කාගෙන් තමාට ලැබිණිද ? තමා මෙවැනි ආභරණ ප්‍රිය කළාදැයි මතකයක් රිදීමාට නැත.

ගෙජ්ජි සැලෙනා හඬක් ඇසුණෙන්, රිදීමා දෑස් පියා ගත්තාය. යුවතියගේ ලාලිත්‍යයෙන් පිරුණු ඒ දෑත් සෙලවුනේ, ඔහුගේ බෙර හඬටය. රිදීමාට දැනුණේ, රිදී රේඛාවලින් සටහන් වන සිත්තමක් තමාගේ මනසෙහි ඇඳී යන්නාක් මෙනි. සැලෙන ඇගේ දෑතෙහි වූයේ මේ වීදුරු වළලු නොවේද ?. වීදුරු වළලු එකිනෙක වැදීමෙන් නික්මුණේ 'සිලිං ! සිලිං ද්‍යා' නාදයකි.

කාමරයේ දොර හඬක් නොනගා විවර වූයේය.

"රිදීමා...... " ඒ මහීකාගේ හඬය. රිදීමා වහා දෑස් විවර කළාය.
"මොකෝ භාවනා කරනවද ?" අමා විමසුවාය.

"එච්චරයි දැන් අඩු......"

රිදීමා ලාච්චුව වසා දැමුවේ හඬ නැංවෙන්නටය.

යෙහෙළියෝ දෙදෙන ඇඳ මත වාඩි වූහ.

"අන්න අර 'පිංචි' බඩ්ඩ අපි එනකොට නදින් අය්යට දුවලා, දුවලා ඇවිත් කීවා උඹ 'සුදුමැණිකේ' ගැන ඇහුවයි කියලා...." මහීකා පැවසුවාය.

"මොනවා" රිදීමා පැවසුවේ තරහනි.

"අද මම පිංචිට උගන්නන්නම්කො හොඳ පාඩමක් !" තරහා මැඩ ගැනීමට නිසරු උත්සහයක් දරමින් ඈ කීවාය.

"මම මේ කෙල්ල පොරොන්දු කරවාගත්තා කාටවත් නොකියන්න !"

"ඒකම තමා කෙල්ල ඒක කියන්න ඇත්තේ" අමා පසුපසට වී බිත්තියට වාරු වූවාය.

"සමහර මිනිස්සු ඉන්නවා 'එපා' කීවාම ඒකම කරන. 'එපා' කීවාම ඒකට එනවා වැදගත් කමක්. නිකං කරන්න ඕනි කියලා හිත පොළඹවන...."
"ඕකට කියන්නේ 'සයිකලොජි' කියලා" මහීකා ඊට බාධා කළාය.

"ඉතින් මොනවද මේවා අවුස්සලා හොයා ගත්තේ ?"
රිදීමා යට ලාච්චුව හැර, එහි වූ වීදුරු වළලු එළියට ගත්තාය. බැසයන හිරු එළියෙන් බැබලුණු, රතු, නිල්, කහපැහැති වළලු සමූහය මහීකා දෝතට ගත්තේ, කුඩා එකියක් සේ සිනාසෙමිනි.

"අනේ හරි ලස්සනයි !"

"ඒ වගේම ඉක්මණින් කැඩෙනවා" අමා සුසුමක් හෙලුවාය.

"රිදීමා හිතනවද මේ වළලු ඔයාගේ කියලා ?"

"නෑ අමා.... මට කිසිම මතකක් නෑ. මම මේවට කැමති කෙනෙක් නෙවි. ඒත් මේ වළලු දමාගෙන නටපු කෙනෙක්ගේ මතක මගේ හිතේ තියනවා."

ඇය මේසය අසලවූ පුටුවක් ඇද එහි හිඳ ගත්තාය.



"මම පිංචිගෙන් ඇහුවා මේ' සුදු මැණිකේ' ගැන. කෙල්ල කියනවා 'සුදු බේබි' 'සුදු මැණිකේ' වගේමලු. දෙන්නම එකලු. ඒත් දෙන්නා එක්කෙනා නෙමේලු...."

වළලු සමඟ සෙල්ලම් කරමින් සිටි මහීනා හිස එසවූවාය.

"මොකක්ද ඒ කතාවේ තේරුම ?" අමා කල්පනා-වට වැටුණාය.

"ඒ කතාවේ, මේ රහස ඔක්කොම අන්තර්ගතවෙලා තියනවා කියලයි මට හිතන්නේ !"

"නදින් අය්යා මොනවද පිංචිට කීවේ ?" අමා ඇසුවේ මහීකාගෙනි.

"අප්පච්චි ගෙදර ආවාම රෑ කෑමෙන් පස්සේ අද මේ ගැන සාකච්ඡා කරනවා කීවේ....." පැවසුවේ මහීකාය.

"මෙතන අපි නොදන්න යමක් තියනවා රිදීමා. ඔයාලගේ ගෙදර උදවිය නොකියන යමක් මෙතන තියනවා...."

"මටත් ඒක අනිවාර්යෙන්ම හිතනවා" මහීකාද අනුමත කළාය. "නදින් අය්යා අර ගඟේ ගහගන ගිය ළමයා ගැන කිසි-දෙයක් කියන්නේ නැහැ.... ඔයාගේ අම්මා උණත් අපට මූණ දෙන්නේ නැහැ.... මෙතන මොකක් නමුත් රහසක් තියනවා...."

මිතුරියෝ එකිනෙකා දෙස බලා ගත්තෝය.

රිදීමා පුටු ඇන්දට හේත්තුවී දෙකකුල් දිග හැරියාය. ඇගේ හිසට දැනුණෝ වෙහෙසකි. තමා යමක අවසානය කරා වේගයෙන් ගමන් කරන්නාක් මෙනි, ඇයට දැණුනේ.

"මම නිශ්කව ගඟ ළඟදි දැක්කා !"

"මොනවා ?" අමාද, මහීකාද එක්වර පැවසුවෝය.

"මම ගියේ පිංචිව තනි කරලා කතා කරන්න ඕනි නිසයි. ඒත් අපි යනකොටත් නිශ්ක එතන හිටියා උස, හීන්දෑරි කෙනෙක් එක්ක....."

මහීකා වළලු ටික ඉහළට ඔසවා හඬක් නැංවූවාය.

"නිල්, රතු කොටු සරමක් ඇඳලා......"

"හරියට හරි මහී කොහොමද දන්නේ ?"

"එයා උදේ ආවා දිනූෂලගේ ගෙදර. කාරෙක එළවන්න බාරදීලා තියෙන්නේ එයාට. නම සුමති....."

"ඉතින් නිශ්ක ඔයාව දැක්කද ?" අමා ඇසුවාය.
"නෑ..." අමා මහීකා දෙසට හැරුණාය.

